# ‘අපට ලොක්කන් නැතුවම බැරි ද?

## පශ්චාත් අරගල දේශපාලන සන්දර්භය පිළිබඳ මහජන අදහස්’ රැගත්

**නීතිය හා සමාජ භාරය විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රකාශනය එළිදැක්වීමට සමගාමී ව 2023 මාර්තු 31 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වුනු සාකච්ඡාවේ දී ෂෙනු පෙරේරා විසින් සිදුකළ අදහස් දැක්වීම**



“අපි අලුත් හීනයක් දකිනවා නම් ඒ හීනය ඉතාම අපහසු එකක් වෙන්න පුළුවන්. අපි අනිත් පැත්තට හැරිලා අහන්න ඕනි සිවිල් සමාජ සංවිධාන විදියට, ආගමික ආයතන විදියට, රටක් හැටියට, ජාතියක් හැටියට, ආගමක් හැටියට මේ මොන කණ්ඩායමක් හැටියට ගත්තත් අපි ඇත්තටම ඉස්සරහට කරන්න යන්නේ මොකක් ද? කියල. අපිට ඕනි කණ්ඩායම් කිහිපයක් අරගෙන ඒගොල්ලන්ව පාවිච්චි කරලා අපේ වැඩේ ගොඩ දාගන්න එක විතර ද? එහෙම නැතිනම් අපිට ඇත්තටම වුවමනවාක් තියෙනවා ද මිනිසුන්ගේ ප්‍රශ්න අපේ ප්‍රශ්න කර ගන්න...... අපිට බැරි නම්, වතු කම්කරුවෝ, ගොවීන්, ධීවරයෝ, නිදහස් වෙළඳ කලාපයේ අපේ සහෝදර සහෝදරියෝ, ක්ෂුද්‍ර මූල්‍ය ණය හින්දා සියදිවි නසාගන්න බල කෙරෙන අම්මලා තාත්තලා, උතුරේ-දකුණේ මේ හැම කණ්ඩායමක් දිහාම එළියට ඇවිල්ලා බලන්න පුළුවන්, අනුරාගයෙන් දේශපාලනය කරන්න පුළුවන් කණ්ඩායමක්, තරුණ නායකත්වයක්, වැඩිහිටි නායකත්වයක් මේ හැමෝගේම එකතුවක් මම හිතනවා මේ රටට ඕනි කියලා අරගලයේ ඊළඟ කොටසට යන්න නම්.”

මේ පොත කියවද්දී විශේෂයෙන් මට ගොඩක් බලපාපු කාරණාවක් තමයි ජනතාව ලබාදුන් අදහස් කියන කාරණාව. ඒ කියන්නේ අවුරුදු 75ක් පුරා ම අපේ රටේ දේශපාලනය ගත්තත්, සංස්කෘතිය ගත්තත්, ආගමික ආයතන ගත්තත්, සිවිල් සමාජ සංවිධාන ගත්තත් අපි ක්‍රියාත්මක වෙන්නේ අපිට ලබාදුන් අදහස් ගොන්නක් මත ඉඳගෙන. ඒක ඕනෙම රටක එහෙම තමයි. හැබැයි මේ ලබාදුන් අදහස් අපි මතට බලයෙන් පටවපු ජනතාවක් විදියට අපිට උග්නවපු අදහස් කිසි දවසක පෙරළා ප්‍රශ්න නොකර ඒවා ඒ විදියට ඉස්සරහට අරගෙන යෑමේ හෝ පිළිපැදීමේ ශාපය අපි දැන් ගෙවමින් ඉන්නවා කියලා මම හිතනවා. මේ පොතේ 15 වෙනි පිටුවේ එක තැනක කියනවා, ගුණදාස අමරසේකර මහතාගේ ලේඛණයන උපුටනයක්. ඒකෙ මෙහෙම කියනවා. “2005 දී ජනතාව මහින්ද රාජපක්ෂ බලයට පත්කර ගන්නේ සිය ජාතික උරුමය රුහුණෙන් පහළ වූ නායකයෙකු අතින්වත් ඉටුකර ගත හැකි වේ යැයි යන ප්‍රාර්ථනය උඩයි. ඔහු සවෙනි පරාක්‍රමබාහුගෙන් පසු රට එක්සේසත් කළ නරවරයා වශයෙන් හඳුන්වනු ලැබීම යුක්ති සහගත වෙයි.” මේක තමයි මේ රටේ අපි සලකන විද්වතුන්, විශිෂ්ඨයෝ කියලා සලකන අය, නායකයෝ කියලා සලකන අය, මත නිර්මාණය කරන්න පුළුවන් කියලා සලකන බොහෝ දෙනෙක් අරගෙන ආපු සහ අපට දායාද කරපු මතය. අපි කියනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, සිංහල බෞද්ධ උරුමය රැක ගන්න ඉන්න, බිම් මට්ටම ගැන අවබෝධයක් තියෙන,

ජනතාවට බොහෝම සංවේදී වෙච්ච, ගමේ මනුස්සයාට සංවේදී, අධිරාජ්‍ය විරෝධී, වාමවාදී, සුබසාධනවාදී මෙවැනි පක්ෂයක් කියලා. ඊට පස්සේ අපිට කියනවා යූඑන්පී එක කියන්නේ බටහිරට ගැති, ධනවාදය නියෝජනය කරන, නව ලිබරල්වාදය මේ රටට අරන් එන, විවෘත ආර්ථිකය ගැන කතා කරන පක්ෂයක් කියලා. ඊට පස්සේ කියනවා ජේවීපී එක කියන්නේ වම. පෙරටුගාමීන් කියන්නේ වම. එතකොට ඒගොල්ලෝ නියෝජනය කරන්නේ තවත් එකක්. ඒ හින්දා ඒගොල්ලෝ 3% ට හෝ ඊට වඩා අඩුවෙන් තියා ගත්තාට කමක් නැහැ. මොකද ඒගොල්ලොත් ඉන්න ඕනි පාර්ලිමේන්තුවේ. අපේ ගම්වල නිතර කියන කතාවක් වමේ අය ඉන්න ඕනි අර දෙගොල්ලේම වැරදි පාරේ යද්දි පොඩ්ඩක් හයියෙන් කතා කරන්න. යන විදිහ පොඩ්ඩක් upset කියන්න තමයි වම ඉන්න ඕන. එතකොට මේවා තමයි අපිට දීලා තියෙන මතයන්.

ඊට පස්සේ සිවිල් සමාජ සංවිධාන ඉතිහාසය ගැන බලද්දී මුලින් මානව හිමිකම් ගැන කතා කරන්නේ කවුද ? මහින්ද රාජපක්ෂ තමයි මානව හිමිකම් ගැන කතා කරලා ජිනීවා යන්න plan කරන්නේ. ඊට පස්සේ මුලින්ම ඉතිහාසයේ වාසුදේව නානායක්කාර වැනි පුද්ගලයෝ තමයි NGO පටන් ගන්න ඉතිහාසයේ මුල ඉන්නේ. අම්මලාගේ දුකට සංවේදී වෙලා, යුක්තිය ගේන්න ඕනි කියලා කෑ ගහපු ඉතිහාසයේ ඉන්නේ එයාලා. එතකොට සිවිල් සමාජ සංවිධාන අදටත් අරගෙන යන්නේ කවුරු ලබාදුන් අදහස් ද? කවුරු අපි මත පටවපු ප්‍රතිපත්තිද ආරක්ෂා කරන්නේ? අපි defend කරන යන මානව හිමිකම් සැලසුම් කළේ කවුද? අපි පෙනී ඉන්න මානව හිමිකම් අපිට නිර්වචනය කරලා දුන්නේ කවුද කියන ප්‍රශ්නය අහනවා ද අපි? ඒ වගේම විමල් වීරවංශ මහත්තයා නිතර කියපු කාරණයක් නේ අධිරාජ්‍ය විරෝධි, අධිරාජ්‍යවාදීන්ගේ කුමන්ත්‍රණයක් මේක කියලා. එතුමා මේක නිතර මැතිරුවා. එතකොට කවුද මේ අධිරාජ්‍යවාදය? කවුද මේ බටහිර ? එතකොට බටහිර එක්ක ඇත්තටම බණ්ඩාරනායක මහත්තයා upset එකේ ද හිටියේ. මහින්ද රාජපක්ෂ මහත්තයා බටහිරත් එක්ක තරහ ද? බැරි වෙලාවත් යුරෝපයට යන්නේ නැද්ද? ඒක වමට ඇලජික් ද? එතකොට වම කොහේද යන්නේ ? මම හිතනවා අපිට විනයක් හෝ ඇත්ත වුවමනාවක් අපිට තිබිලා නැහැ කිසිදාක මේවා ගැඹුරින් ප්‍රශ්න කරන්න. මොකද අපිට තිබුනේ ඊට වඩා වෙනස් එකක්. මොකද අපිට තිබුණා අපේ ආගම රැක ගන්න, අපේ ජාතිය රැකගන්න ඕන, අපේ ආයතන ටික රැක ගන්න ඕන වගේ බොහෝම වැදගත් කාරණාවක් අපිට තිබුණා. ඒ හින්දාම තමයි අද වෙද්දි අපිත් එක්ක ගොල්ෆෙස් හෝ ඊට කළින් අරගලවල හිටපු අපේ මිත්‍රයෝ අද ලියන්නේ කාංචන මහත්තයා දවසක නාමල් මහත්තයාට අභියෝගයක් වෙන්න පුළුවන් තරමේ ශක්‍යතාවක් තියෙන නායකයෙක් කියල. එයා මේ වෙලාවේ හරියට බැට් කළොත් එයාට පුළුවන් නාමල්ට අභියෝගයක් වෙන්න. අපි ඔයා දිහා බලන් ඉන්නවා කියලා. මං කියන්නේ අපිට කොහොම ද අමතක වෙන්නේ මේ ලංකාවේ දේශපාලනය හැදිලා තියෙන්නේ ප්‍රභූන් සහ ප්‍රභූන්ව ආරක්ෂා කරන ගොඩනැගුණු ආරක්ෂක හෙංචයින්ගේ එකතුවකින් කියන එක. භූපති ඕකට කියනවා පාදඩ පන්තිය කියලා. මං ඒ වචනය කියන්නේ නැතුව ඉන්නම්, මට ඒ වචනය කියා ගන්න අමාරුයි. අපි දන්නවා මේ ප්‍රභූන්ව නියෝජනය කරන්නේ කවුද? ප්‍රභූන්ව නියෝජනය කරනවා නාමල්. නාමල් එක්ක එකට ෆයිට් එකේ ඉඳලා උස්සලා තියන්නේ කවුද? කාංචන. එතකොට අපිට කොහොම ද මේ හැමදේම අමතක වෙන්නේ, අපිට හරි ලෙහෙසියි පල්ලෙහාට දාලා කතා කරන්න, පුත්තලමෙන් එන එක්කෙනා ගැන. අපි එයාට එක එක නාම කියනවා නේද, පුත්තලම් බූරුවා කියනවා එක එක නම්වලින් අපි එයාට කතා කරනවා. සනත් නිශාන්ත මහත්තයාට. අපේ යාලුවෝ නිතර කියනවා සනත් නිශාන්ත මහත්තයා අවංක බූරුවෙක් පුතේ කියලා. ඒක අපි අපි අතර විහිළුවට කියන කතාවක්. අපිට සනත් නිශාන්ත කියන්නේ හෙන upset චරිතයක් කියලා කියන්න පුළුවන්. අපිට එකේ අවුලක් නැහැ. අපිට upset එකක් නැහැ එහෙම කියන්න. හැබැයි අපිට කාංචනගෙන් පේනවා බලාපොරොත්තුවක්. කොහොම ද එහෙම වෙන්නේ? නාමල්ට එන්න මාර්ගය හදමින් ඉන්න කාංචන අපිට බලාපොරොත්තුවක් විදියට පේන්නේ කොහොම ද? කවුද මේවා design කරන්නේ, නිර්මාණය කරන්නේ? මං හිතනවා ඒ ප්‍රශ්නය අහන්න අමතක වෙච්ච අවුරුදු 75ක් තමයි අපි පහුකරගෙන ඇවිල්ලා ඉන්නේ. ඒ ලබාදුන් අදහස්.

ඒක මත අපි ගොඩනගා ගත් අදහස් මොනවද? රනිල් වික්‍රමසිංහ කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන, මානව හිමිකම් රකින නායකයෙක් කියලා නේද අපි හිතන් හිටියෙ? ඒ හින්දා තමයි රනිල් වික්‍රමසිංහ බලයෙන් පහකරලා මෛත්‍රීපාල සිරිසේන සහ මහින්ද අර කඩිමුඩි instant ආණ්ඩුව පිහිටපු වෙලාවේ සියලු සිවිල් සංවිධාන පාරට බැස්සේ, අපි මරාගෙන මැරෙනවා, මේක ව්‍යවස්ථාවට එරෙහිව කරපු බරපතල අපහාසයක් කියලා කිව්වා. මමත් ඒ උද්ඝෝෂනවල හිටියා. ඒ තැන්වල ගිහිල්ලා හිට ගත්තා. මටත් හිතුණා මේක හෙණ බරපතල අපහාසයක් තමයි, මේ හෙණ අවුලක්. ඇත්තටම හෙණ අවුලක් තමයි. හැබැයි රනිල් වික්‍රමසිංහ රකිමින් හිටියේ මොන මානව හිමිකම් ද? රනිල් වික්‍රමසිංහ මානව හිමිකම් රැක්කා නම් අද කඩන්නේ මොනවාද? මේ කඩන්නේ දොර පොලු ද? මේ කඩන්නේ මොනවා ද ඇත්තටම ? අපි අහන්න ඕනි මෙච්චර කාලයක් යූඑන්පී එක, නැතිනම් අනිත් පක්ෂ මානව හිමිකම් රකිනවා කියලා නිර්මාණය කරපු අදහස අපි අරගෙන ආවා නම් අද රනිල් වික්‍රමසිංහ අද කඩමින් ඉන්නේ මොනව ද? එතකොට අපි මෙච්චර කල් රැකලා තියෙන්නේ හදලා දීපු මතවාද, states, fellowship, අරමුදල් මත ඉඳලා අපි දැකලා තියෙන්නේ කාගේ මානව හිමිකම් ද? කාට පක්ෂ වන මානව හිමිකම් ද අපි රැකලා තියෙන්නේ? එතකොට මම හිතනවා එතනින් තමයි මේක කඩා ගන්න පුළුවන් පහසුම එක. දීලිප කිව්වා එයාගේ කතාවේදී අක්ෂ දෙකයි තියෙන්නේ, එකක් මෙතනින් ඉවරයි, මෙතනින් කෙළවගෙන යන්න තියෙන්නේ. එහෙම නැතිනම් අපිට contest එක බලන්න ඕනි agent කෙනෙක් ඉන්න ඕනි කියාල. මං කියන්නෙ

රනිල් මෙච්චරකල් play කලේ ඒක නෙමේ ද? රනිල් අපිට මෙච්චරකල් කියලා දුන්නේ contest එකක් තියෙනවා. ඒ කියන්නේ රාජපක්ෂලා කියන්නේ මානව හිමිකම් ආරක්ෂා කරන්නේ නැති, ජාතිවාදය, ආගම්වාදය promot කරන, ඒවා ගාණකට ගන්නේ නැති මැර ත්‍රාඩ සංස්කෘතියක් නඩත්තු කරන කොටසක්. හොඳින් හෝ නරකින් තමන්ගේ වැඩේ කරගන්න, තමන් ඉන්න ගමට සේවයක් කරන එහෙම කොටසක්. එහෙම අදහසක් තිබුණා, එයාලා සහ එයාලා නියෝජනය කරන ලොකු ප්‍රමාණයක් හිටියා. මං කියන්නේ අපිට තියෙන්නේ මේ option දෙක විතර ද? ඇයි අපි එතනින් නතර වෙන්නේ, එතනින් එහා ගිය එකක් ගැන, බරපතල සහ romantic සහ මම කියන්නේ overdose ගිය හීන දකින්න බැරි ද අපට රටක් හැටියට කියන ප්‍රශ්නය මගේ ළඟ තියෙනවා.

මම ආයෙත් ගොඩනගා ගත් අදහස් කියන කාරණයට එනවා නම් රනිල් සහ එයා නියෝජනය කරගෙන ආපු මානව හිමිකම්, ගරුත්වය මේ වගේ කාරණා එක්ක අපි කතා කරපු මානව හිමිකම් කොහේට ද place වෙන්නේ කියන එක අපි ආයේ හිතන්න ඕනි. දැන් මේ පොතේ එක තැනක කියනවා ගම්වල මිනිස්සු එක්ක කතා කරද්දී බොහෝදෙනා කියනවා මහින්ද මහත්තයලා ආගම, ජාතිය පාවිච්චි කළා කියලා අපිට දැන් තේරේනවා, එක තරුණියක් කියනවා මට දැන් ලැජ්ජයි මගේ ෆෙස්බුක් profile එක බලද්දී. මම ඇත්තටම ගෝඨට ඡන්දය දුන්නේ මුස්ලිම් අයට පාඩමක් උගන්වන්න, දැන් මේ වෙලා තියෙන දේ බැලුවාම මගේ ගිය අවුරුද්දේ ෆේස්බුක් memory එනකොට ලැජ්ජාවේ පණ යනවා කියලා එයා මේ සම්මුඛ සාකච්ඡාවේ කියනවා. මම කියන්නේ අපි දැනුවත්ව හෝ නොදැනුවත්ව මානව හිමිකම් වෙනුවෙන් පෙනී ඉන්න වගවෙච්ච බොහෝ දෙනෙකුත් මානව හිමිකම් ආරක්ෂා කලේ මේ විදියටම නෙමේ ද? ඒක නිසා නෙමේ ද අදටත් අපිට අර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ logo එක ප්‍රශ්නයක් නොවෙන්නේ? අපි දැක්කා පහුගිය ටිකේ ඒ සාකච්ඡාව උඩ ආවා. උතුරේ ජනමාධ්‍යවේදියෙක් ප්‍රශ්නයක් අහනවා, ඇයි මේ logo එකේ ස්තූපයක් තියෙන්නේ කියලා? මං කියන්නේ මේ වෙලාවේ ලංකාවේ ඉන්න, ප්‍රගතිශීලී මිත්‍රයන්ට පවා බැහැ මේ ගැටලුව ලිහා ගන්න. එයාලා කියනවා මේ ස්තූපය කියන්නේ බොහෝ දෙනෙකුගේ සංකේතයක්, ස්තූපය බෞද්ධ එකක් නෙමේ, පිස්සු කතා කරන්න එපා, මේක නම් දෙමළ අන්තවාදී අදහසක්, එහෙම කියලා තමයි ගොඩක් අය comment කලේ. අපිට කොහොමද අමතක වෙන්නේ ශ්‍රී ලංකා කොඩිය සිංහල මනුස්සයෙකුට දැනෙන විදියයි, දෙමළ මනුස්සයෙකුට දැනෙන විදියයි දෙකක් කියලා. ඒ සන්දර්භය අපිට අමතක වෙන්නේ කොහොම ද? තව සමහර යාලුවෝ අහලා තිබ්බා, මේවා නෙමේ දෙමළ මිනිසුන්ගේ ඇත්ත ප්‍රශ්න අයිසේ කියලා. දෙමළ යාලුවෙක් මගෙන් අහනවා "දැන් අපි කතා කරන්නේ නැති වුණාම අපිට කියනවා අපි කතා කරන්නේ නැහැ කියලා." මම කියන්නේ ඒ ඇත්තට අවංක වෙන්නවත් අපිට තවම බැහැ. අපිට තවම තේරුම් ගන්න බැහැ. මේ රටේ වැඩි හරියක් ඉන්නේ බෞද්ධ මිනිසුනේ, උතුරේ බෞද්ධ දහමට අයිති පුරාවිද්‍යා සංකේත, නටබුන්, ගොඩනැගිලි මතු වෙන එක සාමාන්‍යයි. ඒක බෞද්ධ වෙන්න පුළුවන්. හැබැයි උතුරේ මිනිස්සු අහන ප්‍රශ්නයක් තියෙනවා. ඒගොල්ලෝ අහනවා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් මේ කැණීම් කරන්න එද්දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එක්ක එනවා හමුදා නිලධාරීන් සහ හාමුදුරුවරු. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කවදා ඉඳන් ද හාමුදුරුවරුන්ට පත්වීම් දෙන්න ගත්තේ. ඒගොල්ලෝ මේ ප්‍රශ්ණය අහන්නේ අද ඊයේ නෙමේ, 2009 ඉඳන් අහන ප්‍රශ්නයක්. තවම උත්තරයක් දෙන්න අපිට බැරිවෙලා තියෙනවා. එතකොට මෙහෙම තමයි අපේ රටේ ප්‍රශ්න නිර්මාණය වෙලා තියෙන්නේ. අපේ රටේ ආර්ථිකය, සංස්කෘතිය ඒ ඔක්කොටම වඩා ඉහළින් දකුණට ප්‍රශ්නයක් දීලා තියෙනවා ආගම, ජාතිය, අපේ බෞද්ධ ආයතන රැක ගන්න. ඒ ඔක්කොම රැකගන්න අපිට නියමයක් දීලා තියෙනවා.

ගොඩනගා ගත් අදහස් කියන එකෙන් මට මතුකරන්න ඕන තවත් කාරණයක් තමයි පන්තිය. ගොල්ෆේස් අරගලයේදී පවා අපි සමහර දෙනෙක්ට ඒක අමතක වුණා ඉතා වේගයෙන්. හැබැයි පන්තිය කියන කාරණාව ගොල්ෆේස් අරගලයේ ලොකු කාර්යයක් ඉෂ්ට කළා. අපි පිළිගන්න කැමති වුණත්, අකැමති වුණත් පන්තිය කියලා සාධකයක් තිබුණා. ගොල්ෆේස් අරගලය අනිත් අරගලවලට වඩා ලෝකය දැන ගත්තේ එතනට ආපු ඉංග්‍රීසි කතා කරන, සමාජ මාධ්‍ය පාවිච්චි කරන, ඉතා වේගයෙන් අන්තර්ජාතික සංවිධාන එක්ක, මිත්‍රයෝ එක්ක සම්බන්ධ වෙන්න පුළුවන් අය නිසා. මේ අයගෙන් ප්‍රයෝජන තිබුණා. ඒක නරක නැහැ, ඒක හොඳයි. එතන class තිබුණා. හැබැයි ඒ class එකට මග හැරිච්ච දෙයක් තිබුණා. මම හිතනවා අපි හැමෝම එකතුවෙලා අර ක්‍රිස්තියානි භාෂාවෙන් කියනවා පොදු මනස්ථාපයකට යන්න ඕනි කියලා. බෞද්ධ භාෂාවෙන් කියනවා නම් මෙනෙහි කිරීමකට යන්න ඕනි. අපි පොදු මෙනෙහි කිරීමකට යන්න ඕනි කොහොමද class card එක play වුනේ මේ අරගලය ඇතුලේ කියලා. ඒක අමතක කරන්න කරන්න කරන්න අපි ඇත්තටම හිරවෙලා ඉන්න ප්‍රශ්නවලට උත්තර හොයා ගන්න බැරුව යනවා කියන එකයි මගේ අදහස. දැන් කියනවනෙ ගෝඨා අසමත් කියන අදහස 2022 ආපු එකක් කියල. මම අහන්නේ ගෝඨාභය පත්වුනේ ලක්ෂ 69 ක ඡන්දවලින්. එතකොට ගෝඨාභය පත් වෙන කොට වැඩි හරියක් දැනන් හිටියේ නැද්ද ගෝඨාභය කියන්නේ අමු ජාතිවාදී මනුස්සයෙක් කියලා. යුද අපරාධ චෝදනා තියෙනවා කියලා, හොරකම් කරලා තියෙනවා කියලා, එයාගේ දරුවෝ පවා සම්බන්ධයි මේකට කියලා දැනගෙන හිටියේ නැද්ද? දැනගෙන හිටියා. ඒ දැනගෙන තමයි ලක්ෂ 69ක් ඡන්දය දීලා ගෝඨාභවය පත් කලේ. එතකොට ගෝඨාභය fail කියලා ජේන්න ගත්තේ 2022 ද? එතකොට එච්චරකල් නිදාගෙන ද හිටියේ? එච්ච්චරකල් කොහොද තිබ්බේ අපේ හෘදය සාක්ෂිය? මොකද වෙලා තිබ්බේ? අපිත් එක්ක අරගලයේ හිටපු මිත්‍රයෝ පවා කියනවා ඡන්දය දුන්නේ මෙහෙම වෙයි කියලා හිතලා

නෙමෙ කියලා. සමූල ඝාතනවලට චෝදනා තියෙන, හොරකම්වලට චෝදනා තියෙන, උතුරේ විතරක් නෙමේ දකුණ, නැගෙනහිර හැමතැනම වැරදිවලට චෝදනා තියෙන මනුස්සයෙක් පත්කරද්දි එයා fail කියලා අපිට තේරුනේ නැද්ද? යම් යම් කණ්ඩායම් එකතු වෙලා හොරාකෑම ගැන කතා කරද්දි, කලු සල්ලි සුදු සල්ලි මේවා ගැන කතා කරද්දි විතර ද අපිට මේ පවතින ආණ්ඩු fail කියලා තේරුනේ. එතකම් අපි හිටියේ කොහෙද? මම හිතනවා ඒ කාරණාව අපි කතා කරන්න ඕනි කියලා. අරගලය පැත්තට ආවොත් එහෙම, මම දැක්කා භූපති කියනවා අරගලය කියන්නේ බල ශක්ති අර්බුදය හින්දා හටගත් දෙයක් කියලා. ඇත්තටම මිනිස්සු වැඩි හරියක් පාරට බැස්සේ බල ශක්ති අර්බුදය දරා ගන්න බැරුව. මැද පන්තිය පාරට බැස්සේ එහෙම. හැබැයි මම හිතනවා මැද පන්තියට මඟ හැරුණු කාරණාව, මම මුලිනුත් කතා කරපු යුක්තිය කියන කාරණාව. අපිට කඩා වැටෙන ආර්ථිකය ගැන, කෑම කන්න බැරි එක ගැන, දුක ගැන, ළමා මන්දපෝෂණය ගැන, ගර්භනී මව්වරුන්ගේ අවශ්‍යතා ගැන, අධ්‍යාපනය අඩාලවීම ගැන, මේ ඔක්කොම ගැන කතා කරන්න පුළුවන්. හැබැයි මේ ඔක්කොම එක තැනකට ලඝු වෙනවා නම්, ගොනුවෙනවා නම් මම හිතනවා ඒක තමයි යුක්තිය කියන කාරණාව. අරගලයේදී අපිට momentum එක රඳවා ගන්න බැරි වුනේ ඇයි කියලා කවුරු හරි අහනවා නම් මම විශ්වාස කරනවා අරගලය ඇතුලේ සහභාගී වෙච්ච කණ්ඩායම් විශාල ගණනාවක් ඉන්නවා, ඒ හින්දා එක්කෙනක් කියලා නැහැ. ඒ හින්දා තමයි අපහසුව තියෙන්නේ, තීරණ ගැනීමේ අපහසුව. අවුරුදු 75ක් පුරා දකුණ විසින් නොකඩවා කළ වරදක් කළා කියලා මම හිතනවා අරගලය ඇතුලේ අපි හැමෝම. ඒක තමයි අපි ගොවීන්ට, වතු කම්කරුවන්ට, ධීවරයන්ට ආරාධනා කළා එන්න කියලා. ඒ එන්න කියලා ආරාධනා කලේ අපිට ඔවුන්ගේ නියෝජනයක්, representation එකක් ඕනි නිසා. අරගලය දවස්වල කට්ටිය එකට නෝම්බි ඇල්ලුවා, ඊට පස්සේ අවුරුදු කෑවා, මුස්ලිම් මවුලවිලා අතින් හාමුදුරුවරුන්ට කෑම බෙදුවා, එක එක සංදර්ශන තිබුණා. අපි මෙච්චරකල් පවත්වා ගෙන ආපු බල ධූරාවලිය එහෙන් පිටින්ම maintain කරමින් හැබැයි සහජීවනය ගැන කතා කරන ලස්සන අංග ගොඩක් තිබුණා. හැබැයි ඒවා කරද්දි අපිට ඕන වුණා පොඩි ත්‍රිල් එකක් වගේ ආවා දැන් ඔක්කොම එකයි, මාරයි දැන් මෙතන දැනෙන අත්දැකීම කියලා. හැබැයි ඇත්තම කතාව ඇත්තටම අපිට ඕනි වුනේ representation. අපිට ඕනි වුනේ නැහැ වල්සපුගල ගොවීන් වෙච්චා, මොණරාගල ගොවීන් වෙච්චා මේ ගොවීන්ගේ අරගලය අපේ එකක් කරගන්න. අපිට ඕනි වුනේ එයාලත් ඇවිත් මෙතන ඉද්දි අපිට කියන්න, පේනවා ද අපි ඔක්කොම එකට සෙට් වෙලා මේ game ගහන්නේ කියලා. අපිට ඕනි වුනේ නැහැ මීගමුවේ ධීවරයන්ගේ අරගලය අපේ එකක් කරගන්න. අරගලයට සම්බන්ධ වෙච්ච බොහෝ මැද පාන්තිකයන්ගෙන් අපි අද ඇහුවොත් එහෙම මේ දවස්වල මොකද වෙන්නේ මීගමුවේ, හලාවත ලයින් එක, මොරටුවේ ලයින් එක මොකද වෙන්නේ ධීවරයන්ගේ ප්‍රශ්න මොනවා දකියලා කවුරුත් දන්නේ නැහැ. මම කියන්නේ අපි හැමෝම හැම දෙයක්ම දැනන් ඉන්න ඕනි නැහැ. හැබැයි කොටස්වලට බෙදිලා අනෙකාගේ අරගලය, තනි තනි වෙලා තියෙන අරගල අපේ එකක් බවට පත්කර ගන්න තිබුණ හැකියාව අපිට නැති වුණා. අර panel organize කරද්දි අපි කියනවා නේ ගැහැනු අය එක්කෙනෙක් හරි එන්න ඕනි නැතිනම් ස්ත්‍රීවාදීන්ගෙන් කරදරේ කියලා. ඒ වගේ අරගලය මාර inclusive එකක් කියලා කියන්න අපිට ඕනි වුණා representation එකක්. අපිත් එක්ක වැඩ කරන තේ වතු කම්කරුවෝ ආවා, දැරණියගලින්, මාලිබඩින්, දොලොස්වල කන්දෙන්. අපිත් එක්ක වැඩ කරන මීගමුවේ තාත්තලා ආවා. මීගමුවෙන් ධීවරයෝ මහ ගොඩක් ආවා. එගොල්ලෝ ආවේ අද දෙකෙන් එකක් වෙනවා කියලා. අපි ඊට කලින් දවසේ ගිහිල්ලා එගොල්ලෝ අරන් එද්දීම කියන්න ඕනි වුණා ගහගන්න නම් එපා කියලා. ඒ කියලා මෙතනට ආවාට පස්සේ සමහර තාත්තලා කිව්වා යන්නේ නැහැ මෙතන ඉන්නවා දිගටම කියලා. එයාලාගේ වයිෆ්ලා කතා කරලා කියනවා මූව එවන්න ඔතන තියාගන්න එපා, කාට හරි ගහයිද දන්නේ නැහැ කියලා. මේක තමයි ඇත්ත එක. මම කියන්නේ මීගමුවේ ධීවරයෝ හැම කෙනෙක්ම ගහගන්න ආවා කියලා නෙමේ. හැබැයි එහෙම ආපු අය හිටියා. හැබැයි මම හිතන්නේ නැහැ අරගලයේ ගොඩක් නායකත්වය ගත්ත අයට අඩුම ගානේ ඒ ධීවරයෝ හම්බ වුණා කියලා, කතා කරන්නවත් ඉඩක් හම්බ වුනේ නැහැ. එගොල්ලන්ගේ ගැටලුවත් එක්ක ඒකාත්මික වෙන්න ඉඩක් හම්බ වුනේ නැහැ. මං හිතනවා අපි ඉතිහාසය පුරාම කරමින් හිටියේ representative politics. ඒක තමයි ජාතික නිදහස් උළෙලට දෙමළ විදිහට ඇඳගත්ත ගැහැනු ළමයෙක්ව ඒ විදියට නග්ගලා අපි සතුටු වෙනවා පොඩි පොඩි වැඩ අපි කරන්නෙ. මුස්ලිම් යාලුවෙක් එක්ක ඉඳලා වටලප්පම් කලා අපි post එකක් දානවා මටත් ඉන්නවා මුස්ලිම් යාලුවෝ, අපි විරුද්ධ නැහැ බං උඹලාට කියලා. මුස්ලිම් කඩ කඩද්දි තව ඒවගේ කතන්දර කියනවා. අපි හරි ආසයි ඒ වැඩේට. හැබැයි ඇත්ත එකට අත ගහන්න අපි බයයි.

එඩ්වඩ් ගලියානෝ කියන්නේ මං ආස චින්තකයෙක්. එයා එක තැනක මෙහෙම ලියනවා. I move two steps closer; it moves two steps further away. I walk another ten steps and the horizon runs ten steps further away. i can go always forward and i shell never reach it. what is utopia presite that.it is to advance. ඒක මම සිංහලෙන් ලිව්වා මීට අවුරුදු තුනකට කලින්. එයාගේ අදහස කියන්නේ, "මම පතනා දෙයට පියවර දෙකක් තබා ඉදිරියට යන විට එය මගෙන් පියවර දෙකකින් ඈත්ව යයි. මම පියවර දහයක් එදෙසට යන විට එය මගෙන් පියවර දහයකින් ඈත්ව ඉදිරියට යන අයුරු මට පෙනේ. මට සඳහටම ඉදිරියට යා හැකිය. එහෙත් මම කිසි දිනෙක ඒ වෙත ළඟා නොවනු ඇත. ඉතිං එවැනි යුටෝපියාවකින් ඇති ඵලය කුමක් ද? නිශ්චිතවම ඔබට පවසනවා නම් එහි ඇති ප්‍රයෝජනය නම් දිනපතා ඉදිරියට ගමන් කිරීමයි. නොකඩවා." මම හිතනවා ලංකාවට මේ මොහොතේ අපි ඉන්න මහ ව්‍යසනයෙන් ගොඩ ඒමට වුවමනා නම් යුටෝපියාවක් වෙත ගමන්

කරන්න සිද්ධ වෙනවා. ගොඩක් අයට කියන්න පුළුවන් ඕක ප්‍රායෝගික නැහැ, කරන්න බැහැ කියලා. මගේ මිත්‍රයෝ මට කියනවා ඔයා ප්‍රාර්ථනා කරන එක එහෙම දෙයක් වෙන්න බැහැ. දැන් මේ තියෙන අයගෙන් තමයි වැඩේ ගොඩ දාන්න ඕනි කියලා. දැන් 75ක් තිස්සේ තියෙන අයගෙන් තමයි වැඩේ ගොඩ දාගන්න හදලා තියෙන්නේ, පුළුවන් වෙලා තියෙනවා ද? අඩුගානේ අපිට අවංක වෙන්න පුළුවන් වෙලා තියෙනවා ද? ඒ හින්දාම තමයි අපි professional politics වලින් එහාට ඇවිත් displacement politics වලට යන්න ඕන. හරියට දැන් උදාහරණයක් විදියට ස්ත්‍රීවාදීන් කියන්න ගතතොත් මට ඕනි කරන්නේ සම අයිතීන්, පිරිමි කරන ඔක්කොම ටික මට කරන්න ඕනි. මට ඒකට තමයි සම අයිතීන් ඕනි කියලා මොකක් ද මම දකින අලුත් හීනය. ඒ කියන්නේ මට ඕන කරලා තියෙන්න මේ system එකේම ඉන්න පිරිමියා අයින් කරලා මට එතනට යන්න විතරයි. ඒකද අපේ හීනය වෙන්න ඕනි. ඇයි දැනටත් පිරිමි කර කර ඉන්න මහ පුරුෂාධිපත්‍ය පිරිල තියෙන, ඒකෙන් ගඳ ගහන විදියට දූෂණය වෙලා තියෙන, ඉතාම නරක විදිහට අනෙකාව තලා පෙලා දමන, අනෙකාගේ සිහිනය කුඩු කරලා දාන system එකේ උඩට යන්න ද මම fight කරන්න ඕනි. මම ස්ත්‍රීවාදියෙක් විදියට ඒක ද මගේ හීනය? අර ඉන්න පිරිමියාව අයින් කරලා මම එතන replace වෙන්න ද? නැහැ, ඊට වඩා වෙනස් හීනයක් මට දකින්න පුළුවන්. ඊට වඩා වෙනස් ක්‍රමයක් ගැන, නායකත්වය ගැන අලුත් නිර්වචනයක, ආයතන ව්‍යුහය ගැන, අලුත් නිර්වචනයක්, අලුත් දේශයක්, අලුත් නිදහසක් ගැන. මම කියන්නේ ඒ නිර්වචන දිහාවට යන්නේ නැතිව මේ දැන් තියෙන ක්‍රමයම පොලිෂ් කරලා ඒක අස්සටම රිංගලා අපි පත්වුනොත් අපිට පුළුවන් මේක වෙනස් කරන්න කියන කතා විතර ද අපිට විකල්පයක් විදියට තියෙන්නේ. මට හිතෙනවා තුන්වන අක්ෂයක් තියෙනවා. අපි ඒ ගැන කතා කරන්න අකැමැති වුණාට තුන්වෙනි අක්ෂයක් තියෙනවා. දෙවෙනි අක්ෂය කමයි මෙච්චරකල් practise වුනේ කියලා මම හිතනවා. ඒ හින්දා තමයි අපිට තුන්වෙනි අක්ෂයක් වුවමනා කරන්නේ. අපිට වුවමනායි අලුත් සිහිනයක් දකින්න පුළුවන් කොටසක්. මම මේ අදහස් දැක්වීම romanticize කරනවා නෙමේ, මට romanticize කරන එකේ අවුලක් ඇත්තෙත් නැහැ. මොකද මිනිස් හැඟීම් ගලවලා අයින් කලොත් මොකක්ද ඉතුරු වෙන්නෙ, මැෂින් එකක් විතරයි. ඒකෙන් ඉස්සරහට යන්න බැහැ. යුද්ධ දිනන්න පුළුවන්. රට බේර ගත්ත නායකයෝ හොයා ගන්න පුළුවන්, හැබැයි රටක් විදියට ඉස්සරහට යන්න බැහැ. ඒ හින්දා මගේ කතාව අවසන් කරන්නම්. අපි අලුත් හීනයක් දකිනවා නම් ඒ හීනය ඉතාම අපහසු එකක් වෙන්න පුළුවන්. හැබැයි මේ තියෙන එකට අනුගත වෙලා මේ මේ උඩට ගිහිල්ලා රට බාර අරගෙන, රට ගොඩ නගමින එහෙම එකකින් කරන්න පුළුවන්ද? එහෙම නම් ග්‍රීසිය දිහා අපිට බලන්න සිද්ධ වෙනවා. ග්‍රීසියේ මොකද වුනේ කියලා අපිට අහන්න සිද්ධ වෙනවා. අපිට ඕනි නම් ලෝකය දිහා බලලා ඉගෙන ගන්න case studies ඕනි තරම් තියෙනවා. එහෙම බලලා අපි අනිත් පැත්තට හැරිලා අහන්න ඕනි සිවිල් සමාජ සංවිධාන විදියට, ආගමික ආයතන විදියට, රටක් හැටියට, ජාතියක් හැටියට, ආගමක් හැටියට මේ මොන කණ්ඩායමක් හැටියට ගත්තත් අපි ඇත්තටම ඉස්සරහට කරන්න යන්නේ මොකක් ද? අපිට ඕනි කණ්ඩායම් කිහිපයක් අරගෙන ඒගොල්ලන්ව පාවිච්චි කරලා අපේ වැඩේ ගොඩ දාගන්න එක විතර ද? එහෙම නැතිනම් අපිට ඇත්තටම වුවමනවාක් තියෙනවා ද මිනිසුන්ගේ ප්‍රශ්න අපේ ප්‍රශ්න කර ගන්න.

හාමුදුරුවෝ මතු කළා අපි ඒගොල්ලන්ට කියන්න ඕනි, නෑ ඔගොල්ලන්ගේ වැඩ අපි ඒක කරලා දෙන්නම් කියලා නෙමේ අපි ඒගොල්ලන්ව බල ගන්වන්න ඕනි කියලා. බල ගන්වන්න පවා මම හිතනවා අපි දැන් කරමින් ඉන්න එකේ අවුලක් තියෙනවා. අපි ඒගොල්ලෝ ළඟට යන්නේ නැති නම්, අපි ඒ මිනිස්සු එක්ක කතා කරන්නේ නැති නම්, අඩුම ගානේ අපි ජාතිවාදී, අපි ආගම්වාදී කියලා අපිට තවම පිළිගන්න බැරි නම් මම හිතනවා ඒකේ බරපතල අවුලක් තියෙනවා. නිතර නිතර මතුවෙන ගැටලුවක් තමයි අපි සාකච්ඡාවලදි කිව්වාම, සමහර දේශපාලන පක්ෂවලට වේවා, ඕනම කණ්ඩායමකට වේවා, අපි කිව්වාම ඔයාලා ඔය ඉන්න තැන ජාතිවාදී එකක්, ඔතනින් එළියට එන්න, ඕක upset කියල. උදාහරණයක් විදියට අපි කිව්වොත් බර අච්චලින් ගහන්න කියපු එක අවුලක්, මේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ලොගෝ එක ගැන සාකච්ඡාවේ දි ඔයා ඉන්න තැන අවුලක් කියලා කියපුවාම එගොල්ලෝ කියනවා නැහැ නැහැ එහෙම නෙමේ. යුද්ධය ඉවර කරපු එක හොඳයි හරිද, මුස්ලිම් අයගෙත් අවුලක් තියෙනවා තමයි නේද? මුස්ලිම් අයගේ පොඩි cult එකක් වගේ තියෙනවානෙ, 100%ක් ෂුවර් කරන්න බැහැ. කෝකටත් ඇහැ තියන් ඉන්න එක හොඳයි. පල්ලිවලින් මන්න හම්බ වුනා නේ. මේකේ අවුලවත් දකින්න තරම් අවංක වෙන්න අපිට බැරි නම්, narration හදන්නේ කවුද කියන එක ගැන ප්‍රශ්න කරන්න අපිට බැරි නම්, තේ වතු කම්කරුවෝ, ගොවීන්, ධීවරයෝ, නිදහස් වෙළඳ කලාපයේ අපේ සහෝදර සහෝදරියෝ, ක්ෂුද්‍ර මූල්‍ය ණය හින්දා සියදිවි නසාගන්න බල කෙරෙන අම්මලා තාත්තලා, උතුර දකුණ මේ හැම කණ්ඩායමක් දිහාම එළියට ඇවිල්ලා බලන්න පුළුවන්, අනුරාගයෙන් දේශපාලනය කරන්න පුළුවන් කණ්ඩායමක්, තරුණ නායකත්වයක්, වැඩිහිටි නායකත්වයක් මේ හැමෝගේම එකතුවක් මම හිතනවා මේ රටට ඕනි කියලා අරගලයේ ඊළඟ කොටසට යන්න නම්. මහින්ද රාජපක්ෂගෙන් ඉගෙන ගන්න දේවල් ස්වල්පයක් තියෙවා. එකේ වැදගත්ම දේ තමයි අනුරාග යෙන් දේශපාලනය කිරීම. එයාගේ මම හිතනවා අපිට එයාගේ මොනවා හරි මතක තියාගන්න ඕනි නම් මම හිතනවා ඒ මනුස්සයාගේ එයා කොහොම ද අනුරාගයෙන් දේශපාලනය කළේ කියලා. එයාට වඩා හොඳ උදාහරණ තියෙනවා. අපිට අනුරාගයෙන් දේශපාලනය කරන්න පුළුවන් ජනතාවක් ඕනි. ඒ ජනතාව අලුතින් හැදෙන්නේ නැහැ. මේ ඉන්න අයගෙන් තමයි හදාගන්න වෙන්නේ.

මේ පොතේ එක තැනක එනවා 31 පිටුවේ "ජාතිකවාදය, අපේකම, සදාචාරය, සංස්කෘතිය, බටහිර විරෝධය, ගැමිකම යනාදිය තවදුරටත් දේශපාලනයේ වැදගත් සාධක

බව බොහෝ දෙනෙකු විශ්වාස කරන බව" මේ research එකෙන් පැහැදිලි වුණා ලු. ඒකෙ මෙහෙම කියනව. "එහිදි අපගේ නිරීක්ෂණය වූයේ එකී අදහස් පද්ධතිය නියෝජනය කිරීමේ හැකියාව මේ වන විට මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් අහිමි කරගෙන ඇති බවයි. නමුත් එක්සත් ජාතික පක්ෂය හා රනිල් වික්‍රමසිංහ පාලනයකට එරෙහිව ජනතාවට ආමන්ත්‍රණය කළ හැකි සටන් පාඨ ලෙස මෙම අදහස් පද්ධතිය තවදුරටත් පවතී. එහිදි එකී අදහස් දරාගත හැකි ශරීරය බවට පත්වනු ඇත්තේ කවුරුන් ද යන්න තවම නොපැහැදිලිය." ඇත්තටම පැහැදිලි නැද්ද? පැහැදිලියි නේද? අපි දන්නවා නේද ඊළඟට මේ terms ටික පාවිච්චි කරලා කවුද එන්න ඉන්නේ කියලා. එහෙම දන්නේ නැති කෙනෙක් නැහැ. මේ terms ටික පාවිච්චි කරන්න පුළුවන් කෙනා කවුද කියලා දන්වා. ලංකාවේ islamophobia plant කරන්න පුළුවන් වුණ කෙනා ඉස්සරහට ඇදගෙන එන්න පුළුවන්. එතකොට මේ අදහස්වලට එරෙහිව සටන් කරන්නේ නැතිව අපි ඡන්දයක් තියලා හරි ඒ වගේ කුඩා සාකච්ඡාවක් මත නම් මේක play කරන්න යන්නේ වමට නෙමේ කිසිම පක්ෂයකට ආයේ බලයට එන්න බැහැ. එන්න පුළුවන් මේ අදහස් පෝෂණය කරන, මේ අදහස්වලට ඉඩ හදලා දෙන, මේ අදහස්වලට අත්දෙකම උස්සලා එහෙයි කියන්න පුළුවන්, හෘද සාක්ෂියක් නැති මනුස්සයෙකුට විතරයි. ඒ මනුස්සයා මේ පොළවේ ඉන්නවා, ඒ මනුස්සයාගේ ශරීරය තියෙනවා, එයා වටා ගොඩනැගුණු සමාජයක් තියෙනවා, විද්වතුන් ඉන්නවා මේක කාලය පිළිබඳ ගැටලුවක් විතරයි. ඒ හින්දා වම කියලා කෑලි 450ට විතර බෙදිලා ගහ මරා ගන්නවා වෙනුවට ඊට වඩා අවංක සංවාදවලට අපිට එන්න පුළුවන්නම්, මේ කාරණාවලට අපිට කතා කරනක්න පුළුවන් නම්, මං හිතනවා අපි තවම පරක්කු නැහැ සහ අරගලය අවසන් නැහැ කියලා.



LAW & SOCIETY TRUST

නීතිය හා සමාජ භාරය
අංක 03, කින්සි ටෙරස්,
කොළඹ 08,
ශ්‍රී ලංකාව
දුරකතන :+ 94 (0) 112684845
ෆැක්ස් :+ 94 (0) 112686843
admin@lstlanka.org
www.lstlanka.org